# 8. භූගෝල විද්‍යාව

## පැවරුම් අංක - 03

**පෘථිවියේ සංයුතිය**

(01) I. පෘථිවියෙහි ජලය ව්‍යාප්ත වී ඇති ආකාර තුනක් සඳහන් කරන්න.

II. මිනිසාට ජලයෙන් ලැබෙන ආයෝජන හතරක් දක්වන්න.

III. වර්තමානයේ ජලයේ ගුණාත්මක බව අඩු වීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් තුනක් සඳහන් කොට ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(02) I. ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම් කරන්න.

II. ජෛව ගෝලයේ සීමාවන් දක්වන්න.

III. ජෛව ගෝලයේ සමතුලිතතාව බිඳවැටීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් තුනක් සඳහන් කොට ඉන් එකකින් සිදුවන බලපෑම විස්තර කරන්න.

(03) I. පෘථිවියේ ව්‍යුහය බෙදෙන ප්‍රධාන ස්තර තුන නම් කරන්න.

II. ව්‍යුහය අනුව පෘථිවි ස්තර අතුරින් කබොල හා ඉහළ ප්‍රාවරණය වෙන් කෙරෙන සීමාව හඳුන්වන නම කුමක් ද?

III. කබොලෙහි විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.